# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2002 අංක 15 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2002 ජූලි මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 අගෝස්තු මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

**2002 අංක 15 දරන ජාතික ආරක්ෂක බදු**
**(සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2002 ජූලි මස 30 වන දින]

එල්.ඩී.–ඕ. 57/2001.

**1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත සංශෝධනය කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2002 අංක 15 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 2001 අංක 4 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1991 අංක 52 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇඇ) ඒ තැනැත්තා විසින් ආනයනය කරන ලද යම් තිරිගු ප්‍රමාණයක හෝ තිරිඟු පිටි ප්‍රමාණයක වටිනාකම ;

(ඇඇඇ) ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙහි සාදන ලද යම් තිරිඟු පිටි ප්‍රමාණයක් හෝ පාන් විකිණීමෙන් ලැබෙන මුදල් ; සහ

(2) ඒ උපවගන්තියේ (ඔ) ඡේදය ඉවත් කිරීමෙන් ".

3. 2001 අංක 4 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ඕ) ඡේදයේ "2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2001 ඔක්තෝබර් මස 1 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් :—

"(ක) 2001 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වන කාර්තුව සඳහා–

(i) 2001 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වන සහ 2001 ඔක්තෝබර් මස 12 වන දිනයෙන් අවසාන වන කාලය සඳහා 2001 නොවැම්බර් මස පහළොස්වන දින හෝ එදිනට පෙර–

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයෙහි සඳහන් පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට හත හමාරකට ; සහ

(ආ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව, යම් මෝටර් කාර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට භාගයකට,

සමාන මුදලක් ; සහ

(ii) 2001 ඔක්තෝබර් මස 13 වන දිනයෙන් ආරම්භ වන සහ 2001 නොවැම්බර් මස 30 වන දිනයෙන් අවසන් වන කාලය සඳහා 2001 දෙසැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර–

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයෙහි සඳහන් පිරිවැටුම

නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට හයහමාරකට ; සහ

(ආ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව, යම් මෝටර් කාර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට භාගයකට,

සමාන මුදලක් ; සහ

(iii) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස්වන දින හෝ එදිනට පෙර, මේ ඡේදයේ (i) වන සහ (ii) වන අනුඡේදවල විධිවිධානවලට අනුකූලව, ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල් වල එකතුව, ඔහු විසින් එම කාර්තුව සඳහා ගෙවිය යුතු බද්දෙන් අඩුකළ විට ඉතිරිවන මුදල ; සහ

(ග) 2002 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන සෑම කාර්තුවක් සඳහා ම :–

(i) ඒ කාර්තුවේ පළමුවන මාසය සඳහා, එම කාර්තුවේ දෙවන මාසයේ පහළොස්වන දින හෝ එදිනට පෙර–

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයෙහි සඳහන් පිරිවැටුම නොවන, එම තැනැත්තාගේ පිරිවැටුම මත සියයට හයහමාරකට ; සහ

(ආ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් කාර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට භාගයකට,

සමාන මුදලක් ; සහ

(ii) ඒ කාර්තුවේ දෙවන මාසය සඳහා ඒ කාර්තුවේ තෙවන මාසයේ පහළොස්වන දින හෝ එදිනට පෙර–

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයෙහි සඳහන් පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුම මත සියයට හයහමාරකට ; සහ

(ආ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් කාර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට භාගයකට,

සමාන මුදලක් ; සහ

(iii) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස්වන දින හෝ එදිනට පෙර, මේ ඡේදයේ (i)

වන අනුඡේදයේ සහ (ii) වන අනු ඡේදයේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණවල එකතුව, ඒ කාර්තුව සඳහා ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් අඩු කරනු ලැබූ පසු ඉතිරි මුදල.".

4. 2001 අංක 4 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එම උපලේඛනයේ 12 වන අයිතමයෙහි "2001 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව" යන වචන හා ඉලක්කම් වෙනුවට "2001 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව එහෙත් 2001 ඔක්තෝබර් මස 1 වන දිනට පෙරාතුව" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) එම උපලේඛනයෙහි අගට පහත දැක්වෙන අයිතමයන් එකතු කිරීමෙන් :—

"(13) 2001 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වන කාර්තුව සඳහා-

(i) . (ii) වන ඡේදයෙහි සඳහන් පිරිවැටුම නොවන පිරිවැටුම මත-

(අ) 2001 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වී, 2001 ඔක්තෝබර් මස 12 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා ලැබෙන පිරිවැටුම මත
සියයට 7.5

(ආ) 2001 ඔක්තෝබර් මස 13 වන දිනයෙන් ආරම්භ වී 2001 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා ලැබෙන පිරිවැටුම මත
සියයට 6.5

(ii) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් කාර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ පිරිවැටුම මත

සියයට 0.5

(14) 2002 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන සෑම කාර්තුවක් සඳහා ම–

(i) මේ අයිතමයේ (ii) වන ඡේදයෙහි සඳහන් පිරිවැටුම නොවන යම් පිරිවැටුම මත

සියයට 6.5

(ii) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් කාර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන පිරිවැටුම මත

සියයට 0.5.".

වලංගු කිරීම.

5. 2001 ඔක්තෝබර් මස 13 වන දිනයෙන් ආරම්භ වී, මේ පනත පාර්ලිමේන්තු පනතක් ලෙස සහතික කරනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ පිරියත, යන්ත්‍ර හෝ උපකරණ නොවන යම් භාණ්ඩයක් ආනයනය කරන ආනයන කරුවෙකුගෙන් ඒ භාණ්ඩයේ වටිනාකමින් සියයට හතහමාරකට අඩු එහෙත් සියයට හයහමාරකට අඩුනොවන මුදල් ප්‍රමාණයක් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකතු කරනු ලබන අවස්ථාවක දී ඒ එකතු කිරීම වලංගු ලෙස කර ඇති බවට සහ කරනු ලබන බවට සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, ඒ එකතු කිරීම සම්බන්ධ සියලු සිවිල් හෝ අපරාධ නඩු පිළිබඳ වගකීමෙන්, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙයින් ආරක්ෂා කරනු ලැබේ.

අන්තර්කාලීන විධිවිධාන.

6. මේ පනත අදාළ වන තැනැත්තකු විසින් ජාතිය රැක ගැනීමේ දායක මුදල් (අවලංගු කිරීමේ) පනත සමග කියවිය යුතු මේ පනතේ 2 වන වගන්තිය ක්‍රියාත්මකවීමේ ප්‍රතිඵලයක්

වශයෙන් 2001 ඔක්තෝබර් මස 13 වන දිනයෙන් ආරම්භව, මේ පනත පාර්ලිමේන්තු පනතක් වශයෙන් සහතික කරනු ලැබූ දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා ජාතික ආරක්ෂක බදු වශයෙන් යම් මුදලක් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවීමට යටත්වන අවස්ථාවක, මේ පනත පාර්ලිමේන්තු පනතක් වශයෙන් සහතික කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත ඔහු විසින් ඒ මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබුවහොත් ඒ තැනැත්තා මේ පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුව කටයුතු කර ඇතැයි සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. ඒ මුදල් ප්‍රමාණය එසේ ගෙවනු නොලැබූ අවස්ථාවක, මේ පනත පාර්ලිමේන්තු පනතක් වශයෙන් සහතික කරනු ලැබූ දින සිට දින තිහක් ඉකුත් වීමෙන් පසුව, එම මුදල ගෙවීම පැහැර හරිනු ලැබ ඇතිසේ සැලකිය යුතු අතර, ඒ තැනැත්තා, ඒ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, ගෙවීම් පැහැර හැර ඇති තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

අතීතයට බලපෑම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට :—

(අ) මේ පනතේ 2 වන වගන්තියේ (1) වන ඡේදය මගින් කරන ලද සංශෝධන, සියලු කාර්ය සඳහා, 2002 පෙබරවාරි මස 21 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය ; සහ

(ආ) මේ පනතේ 2 වන වගන්තියේ (2) වන ඡේදය මගින් කරන ලද සංශෝධන, 2001 ඔක්තෝබර් මස 13 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පතන් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.